## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - 2017

-----------------------------------------------

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමග සංයෝජිතව කියවුයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

(i) ප්‍රමිතයේ 70 ඡේදය ප්‍රකාරව ජංගම හා ජංගම නොවන බැරකම් මූල්‍ය ප්‍රකාශනයේ මුහුණතෙහි වෙනම වර්ගීකරණයක් ලෙස ඉදිරිපත් කළයුතු වුවත් පාරිතෝෂික වෙන්කිරීම් එසේ වර්ගීකරණය කර දක්වා නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 48 ඡේදය ප්‍රකාරව ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර ආදායම් හා වියදම් හිලව් නොකළ යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබූ උපාධි ප්‍රදානෝත්සවයේ ඡායාරූප ගැනීම හා වීඩියෝ ආවරණය කිරීම් සහ පර්යේෂණ ක්‍රමවේදන පාඨමාලාවෙන් ලැබී තිබූ ආදායම් එකතුව රු.7,752,150 ක් හා එම වියදම් එකතුව රු.2,658,283 ක් එකිනෙකට හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ අගය වූ රු.5,093,867 ක් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

(i) විශ්වවිද්‍යාලයේ වත්කම් වසර 5 කට වරක් ප්‍රත්‍යාගණනය කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබූ නමුත් එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබූ අතර නියමිත කාල සීමාව තුළ වත්කම් ප්‍රත්‍යාගණනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.8,710,099,611 ක් වූ දේපල පිරියත හා උපකරණවල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වලින් නිරූපනය නොවුණි.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ පිරිවැය රු.678,909,611 ක්වූ ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව, මෙම වත්කම්වලින් තවදුරටත් භාවිතාකරන වත්කම්වල ඵලදායී ජීවිතකාලය නැවත සමාලෝචනය කර ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10

ප්‍රමිතයේ 19 හා 20 ඡේද අනුව, සේවා සැපයීම ඇතුළත් ගනුදෙනුවල ප්‍රතිඵලය විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි විට වාර්තා කරන දිනයේදී ගනුදෙනුවේ සමාප්ති තත්ත්වය සැලකිල්ලට ගෙන අයභාරය හඳුනාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ එම අවශ්‍යතාවය සම්පූර්ණ කළ කෙටිකාලීන පාඨමාලාවල ගාස්තු ලෙස ලැබී තිබූ රු.7,751,070 ක් සමාලෝචිත වර්ෂයට අදාල ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉඩම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් ගිණුම් ප්‍රතිපත්ති අනුගමනය කරන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබූ නමුත් එම ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම හා ඒකාකාරීව අනුගමනය කිරීම සිදුකර නොතිබුණි.

(i) මෙහෙයුම් කල්බදු යටතේ භුක්තිවිදින ඉඩම් මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මගින් පමණක් හෙළිදරව් කිරීම විශ්වවිද්‍යාලයේ ගිණුම් ප්‍රතිපත්තිය වුවද වසර 30 ක බදු පදනම යටතේ ලබාගත් ගම්පහ අධ්‍යයන මධ්‍යස්ථානය පවත්වාගෙන යන ඉඩම සම්බන්ධයෙන් එසේ කටයුතු නොකර එහි තක්සේරු වටිනාකම රු.42,000,000 ක් මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් යටතේ ගිණුම්ගතකර තිබුණි.

(ii) යම් ඉඩමක නිත්‍යානුකූල අයිතිය නොමැති වුවද එහි භුක්තිය වසර 10 කට අධික කාලයක් පුරා විශ්වවිද්‍යාලය සතුවේ නම් හා එම ඉඩමේ විශ්වවිද්‍යාලය මගින් ගොඩනැගිලි ඉදිකර ඇත්නම් එහි ප්‍රත්‍යාගණන අගය ගිණුම්ගත කිරීම විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තිය විය. එහෙත් වසර 10 ඉක්ම වූ සහ ගොඩනැගිලි ඉදිකර තිබූ අනුරාධපුරය, කුරුණෑගල, අම්පාර සහ අම්බලන්ගොඩ පිහිටි බදු පදනම මත ලබාගෙන ඇති ඉඩම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුස්තකාල ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ සහ විදුලි රැහැන් ඇදීම වෙනුවෙන් දරා තිබූ පිළිවෙලින් රු.2,529,788 ක් සහ රු.3,892,698 ක් සහ කාර්යාල බෙදාවෙන්කිරීම සඳහා දරන ලද රු.9,252,211 ක්ද වශයෙන් එකතුව රු.15,674,697 ක ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් අයභාර වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ආ) මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකයේ වර්ෂ අවසාන තොග වටිනාකම් ගණනය කිරීමේදී පොත් 19,582 ක පිරිවැය ගණනය කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල තොග වටිනාකම එම පොත්වල පිරිවැයට සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) රත්නපුරයේ පිහිටි ඉඩමක් විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීම සඳහා 2011 අගෝස්තු 09 දින එහි තක්සේරු වටිනාකමින් සියයට 25 ක් ලෙස ගෙවා තිබූ රු.443,750 ක් මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වියදමක් ලෙස ගිණුම් ගතකර තිබීම හේතුවෙන් ජංගම වත්කම් රු.443,750 කින් අඩුවෙන් දැක්වුණි.

(ඇ) 2018 වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු.342,168 ක ගොඩනැගිලි කුලී සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී, උපාධි ප්‍රදානෝත්සවයේ නිශ්චල ඡායාරූප ගැනීම හා වීඩියෝ ආවරණය කිරීම් වෙනුවෙන් ලැබී තිබූ රු.3,401,070 ක් හා පර්යේෂණ ක්‍රමවේදන පාඨමාලාවෙන් ලැබුණු රු.248,520 ක් වශයෙන් එකතුව රු.3,649,590 ක් සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

**2.2.4 නොසැසඳූ පාලන ගිණුම්**

----------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව, මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකයට අදාළව තොග ශේෂය හා ලෙජර් ගිණුම් අනුව වූ තොග ශේෂය අතර සමාලෝචිත වර්ෂයේ ආරම්භක හා අවසාන ශේෂයන්හි පිළිවෙලින් රු.47,770,990 ක හා රු.41,245,622 ක නොසැසඳීම් පැවතුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය හා අධ්‍යයන (අනුරාධපුර, යාපනය, වවුනියාව, ත්‍රිකුණාමලය, පොළොන්නරුව, කිලිනොච්චිය, කුලියාපිටිය සහ පුත්තලම) මධ්‍යස්ථාන 08 ක සතියේ දිනවල සහ සති අන්ත දිනවල දේශන පැවැත්වීම පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) නාවල පරිශ්‍රයට අයත් ඉඩම් හා ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානවල ඉඩම් 18 ක් රු.4,427,100,000 කට තක්සේරුකර තිබුණද එම වටිනාකම් සැදූමලත් ඇති ආකාරය එනම් පර්චස් එකක වටිනාකම, පර්චස් ගණන ආදී ලෙස සමස්ත වටිනාකම පිළිබඳ විස්තර විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(ආ) 1988 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා බැඳුම්කර ගිවිසුම් කඩකළ අධ්‍යයන හා අනධ්‍යයන නිලධාරීන් 14 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.48,085,752 ක් අතුරින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය දක්වාම අයකර ගෙන නොතිබුණි. එසේම බැඳුම්කර ගිවිසුම් කඩකල තවත් අධ්‍යයන/ අනධ්‍යයන නිලධාරීන් 14 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.29,860,739 ක් වූ මුළු ගිවිසුම් ගත වටිනාකමින් අයකර ගෙන තිබුණේ රු.20,699,396 ක් පමණක් විය.

(ආ) කාර්යමණ්ඩලයේ 51 දෙනෙකුගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අය නොවූ සේවක ණය ශේෂය රු.1,806,518 ක් වූ අතර ඒ තුළ ආයතනය හැර ගිය කාර්යමණ්ඩලයේ 47 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,613,208 ක්ද, ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට පටහැනිව වැටුප් රහිත නිවාඩු ලබාගත් නිලධාරීන් සිව් දෙනෙකුගෙන් අයවිය යුතු රු.193,310 ක මුදලක්ද විය. අදාළ ණය මුදල් අයකර ගැනීම කෙරෙහි ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ජංගම වගකීම් යටතේ විලම්භිත කෙටිකාලීන ආදායම් ලෙස රු.6,829,000 ක් දක්වා තිබූ අතර එයින් සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් හඳුනාගෙන ආදායමට ගෙන නොතිබූ අතර විගණන අවස්ථාව වූ 2018 ජුනි 30 දින වන විටත් හඳුනාගෙන තිබුණේ රු.1,868,000 ක් පමණක් විය.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති, හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 751(1) | ප්‍රධාන කාර්යාලයෙන් නිකුත් කරන ලද පාඨමාලා පොත් හා අධ්‍යයන ද්‍රව්‍ය සම්බන්ධයෙන් ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානවල තොග පොත් නඩත්තු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 772 හා 773 | ලෝහ භාණ්ඩ හැර නුසුදුසු ලෙස ප්‍රකාශ කර ඇති අනෙකුත් භාණ්ඩ සුදුස්සක් කොට බැහැර කළ යුතු වුවත්, ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ අනුව හඳුනාගත් එවැනි භාණ්ඩ ඉවත් කිරීමට හෝ අලුත් වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව තත්කාර්ය අත්තිකාරම් එය දෙන ලද කාර්ය අවසන් කල විගසම පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ ලබාදී තිබූ රු.133,584 ක් වටිනා අත්තිකාරම් 11 ක් එපරිදි නිරවුල් කර නොතිබුණි. |
| (ඇ) | විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යයන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහයේ | |
| | (i) XX වැනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අංශයේ නිලධාරීන් සඳහා පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | (ii) XXVI වැනි පරිච්ඡේදයේ 3.2 හා 3.3 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ තුළින් හඳුනාගන්නා ස්ථාවර වත්කම් අස්ථානගත වීම් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමෙන් පසු අදාළ ඌනතාවයට, නැතිවීමට හෝ හානියට වගකිව යුතු තැනැත්තා නියමකොට දැනගෙන එම තැනැත්තාගෙන් එය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අගය අයකර ගත යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | උපදේශන සේවා හා බාහිර සම්පත් මධ්‍යස්ථානයට අදාළ 2014 අතුරු නීතියේ 3.3 වගන්තිය | එක් එක් පාඨමාලාවල ප්‍රගතිය පිළිබඳව වාර්තාවක් උපදේශන සේවා හා බාහිර සම්පත් මධ්‍යස්ථාන කමිටුව වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ප්‍රගති වාර්තා එසේ ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.125,553,169 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.164,821,885 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.290,375,054 කින් වර්ධනය වී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන සේවා වියදම රු.199,394,011 කින් වැඩිවී තිබූ නමුත් පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු.112,575,000 කින් හා ශිෂ්‍ය ආදායම රු.388,412,366 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්රතිඵල විග්‍රහ කිරීමේදී 2013 හා 2014 වර්ෂවල මූල්‍ය ප්‍රතිඵලයෙහි අතිරික්තයක් ඇතිවී තිබූ නමුත් 2015 හා 2016 වර්ෂයන්හිදී ඌනතාවයක් ඇතිවී තිබූ අතර නැවත සමාලෝචිත වර්ෂයේදී අතිරික්තයක් වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා රජයට ගෙවන ලද බදු නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ රු.1,457,733,184 ක්වූ ආයතනයේ දායකත්වය විචලනයන් සහිතව සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.1,939,037,275 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්ය සාධනය

---

#### 4.1.1 සැලසුම් කිරීම

---

සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කර තිබුණද අදාළ සැලසුම් උපයෝගී කරගෙන ආයතනයේ සමස්ත අරමුණු ඉටුකරගැනීම කෙරෙහි ඉහළ කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි. තවද, සංයුක්ත සැලැස්ම වසර 04 කට පිළියෙල කර තිබුණද 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 5.1.3 ප්‍රකාරව එය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විවෘත විශ්වවිද්‍යාලය සඳහා දේශකවරුන් බඳවාගැනීමේදී සහ අනෙකුත් ප්‍රතිලාභ ලබාදීමේදී අනෙකුත් විශ්වවිද්‍යාලවල ආකාරයට කටයුතුකර තිබූ නමුත් විවෘත විශ්වවිද්‍යාලයේ දේශන පැවැත්වීම වැඩි වශයෙන් සති අන්ත දිනවලදී සිදු කර තිබීම හේතුවෙන් වැටුප් හා වේතනවලට අමතරව දේශන සඳහා අතිරේක ගෙවීම් ලබාදීමට සිදුව තිබුණි. විගණනයේදී සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව විශ්විද්‍යාලය 2016/2017 වර්ෂවල මධ්‍යස්ථාන 15 ක සතියේ දිනවල සිදුකළ දේශන පැය ගණන 10,776 ක් වූ අතර පැවැත්වූ සති අන්ත දේශන පැය ගණන 29,320 ක් විය. ඒ අනුව මුළු දේශන පැය ගණනින් සියයට 73 ක්ම සති අන්ත දිනවල පවත්වා තිබූ අතර සතියේ දිනවල පවත්වා තිබූ දේශන පැය ගණන සියයට 26 ක් විය.

(ආ) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ප්‍රතිමාන සංග්‍රහය (Norms) ප්‍රකාරව, සාමාන්‍යයෙන් වසර 04 කට වරක් සියලු පාඨමාලා නැවත සංශෝධනය කර යාවත්කාලීන කළයුතු වුවත්, විශ්වවිද්‍යාලයේ බොහෝ පාඨමාලා සම්බන්ධයෙන් එවැනි සංශෝධනයන් (Course Revise) සිදුකර නොතිබූ අතර ප්‍රමාද කාලය වර්ෂ 02 සිට වර්ෂ 24 දක්වා ඉහළ පරාසයක් ගෙන තිබුණි. කෙසේ වුවද, පාඨමාලා සංශෝධනයන් බාහිර පාර්ශවයන් මගින් සිදුකර තිබුණු අතර ඒ සඳහා 2017 වර්ෂයේදී රු.736,465 ක් ගෙවා තිබූ අතර අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් පාඨමාලා සංශෝධනය වැනි කටයුතු වල නිරත වීම හා දේශන පැවැත්වීම ඉතා අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද රු.මිලියන 9,000 ක ණය ආධාර මත දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය විවෘත විශ්වවිද්‍යාලය කේන්ද්‍ර කරගනිමින් 2003 වර්ෂයේදී උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබූ අතර ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියට ගෙනයාම සඳහා ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවය 2010 වසරේදී ස්ථාපනය කර තිබුණි. 2015 මාර්තු 01 දින වන විට ව්‍යාපෘතියේ පරිපාලන කටයුතු විවෘත විශ්වවිද්‍යාලය වෙත පවරා දී තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ව්‍යාපෘතියේ පරිපාලන කටයුතු විවෘත විශ්වවිද්‍යාලය වෙත පවරා 2015 මාර්තු 01 දින වනවිට නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් 04 ක්, ඇතුලුව පරිගණක දැනුම සහිත නිලධාරීන් 61 දෙනෙකු මෙම ව්‍යාපෘතියේ කටයුතු කර තිබුණි. එහෙත් අමාත්‍යාංශයේ උපදෙස් ප්‍රකාරව කාර්යමණ්ඩලය විවෘත විශ්වවිද්‍යාලය වෙත බඳවා ගැනීම සඳහා කටයුතු කර නොතිබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියට අනුයුක්ත කර සිටි නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් 03 දෙනෙකු ඇතුලුව නිලධාරීන් 30 දෙනෙකු ආයතනයෙන් ඉවත්ව ගොස් තිබුණි.

(ii) තාක්ෂණික පහසුකම් උපයෝගී කරගෙන බාහිර පාර්ශවයන්ට සේවා පහසුකම් සැපයීම තුළින් මෙම ව්‍යාපෘතිය මගින් 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා එකතුව රු.100,757,839 ක් උපයා ගෙන තිබුණද අමාත්‍යාංශ පාලනයෙන් බැහැරව විවෘත විශ්වවිද්‍යාලයට ව්‍යාපෘතිය පවරාදීමෙන් පසුව 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ආදායමේ එකතුව රු.7,137,587 ක් දක්වා සීඝ්‍ර ලෙස අඩු වී තිබූ අතර 2017 වර්ෂයේදී කිසිදු ආදායමක් වාර්තා වී නොතිබුණි.

සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘතිය මගින් ශ්‍රව්‍ය දෘශ්‍ය සම්මන්ත්‍රණ පාඨමාලා කිසිවක් පැවැත්වූ බවට සාක්ෂි ඉදිරිපත් නොවූ අතර අදාළ ව්‍යාපෘතිය අසාර්ථක වීමට බලපාන ලද මූලික හේතුවක් ලෙස තාක්ෂණික උපකරණ යල්පැන යාම සහ ඒවා අලුත්වැඩියා කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැපයීමට අමාත්‍යාංශය එකඟතාවය පළකර තිබූ නමුත් පසුව එම මුදල් ලබාදීමට කටයුතු නොකිරීම බව උපකුලපතිවරයා පසුගිය විගණන වාර්තාවලට පිළිතුරු ලෙස දක්වා තිබුණි.

(iii) විවෘත විශ්වවිද්‍යාලය කේන්ද්‍ර කර ගනිමින් අතිවිශාල වියදමක් දරා ස්ථාපිත කර තිබූ මෙම ව්‍යාපෘතිය තුළින් ආයතනයේ මූලික අරමුණක් වන දුරස්ථ අධ්‍යාපනය නවීන තාක්ෂණය උපයෝගී කරගෙන ලබාදීම කෙරෙහි ප්‍රබල දායකත්වයක් ලබාගත හැකිව තිබුණි. එහෙත් මෙම ව්‍යාපෘතිය සාර්ථකව කරගෙන යාම සඳහා ආයතනයේ ඉහළ කළමනාකාරිත්වය ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ධාරිතාවය පුළුල් කිරීම සහ රටට අවශ්‍ය පරිදි ගුණාත්මක උසස් අධ්‍යාපන සේවාවක් ලබාදීම අරමුණු කරගෙන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක කර තිබූ 21 වන සියවස සඳහා උසස් අධ්‍යාපනය (HETC) නැමති ව්‍යාපෘතිය විවෘත විශ්වවිද්‍යාලයේ ක්‍රියාත්මක කිරීමට 2011-2016 දක්වා කාලය තුළ රු.මිලියන 18 ක් ලැබී තිබූ අතර ඊට අදාළව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදාන අරමුදල යටතේ හඳුන්වාදෙනු ලැබූ මූලික පාඨමාලා විශ්වවිද්‍යාලයේ උපාධිය හදාරණ සියලුම ශිෂ්‍යයන්ට අනිවාර්ය වූ පාඨමාලාවකි. එහෙත්, පීඨ මණ්ඩලවල නිර්දේශ මත විශ්වවිද්‍යාල සනාථන සභාව විසින් එක් එක් උපාධි පාඨමාලාවල අනිවාර්ය විෂයයන් තීරණය කර තිබුණි. ඒ අනුව, මූලික පාඨමාලාවේ සියලුම විෂයයන් පිළිබඳ අවබෝධය ඉතා වැදගත් වුවද සියලුම විෂයයන් හැදෑරීමට අවස්ථාව ලබා නොදීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම අවම වී තිබුණි.

(ii) විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදාන අරමුදල් භාවිතාකර මෘදු කුසලතා වර්ධනය කිරීම සඳහා රු.2,175,000 ක වියදමින් අත්පොත් 5,000 ක් මුද්‍රණය කර තිබුණද මෙම පාඨමාලාව සියලුම ශිෂ්‍යයන්ට අනිවාර්ය නොකිරීම මත පාඨමාලාව හදාරා ඇත්තේ 2,000 කටත් අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් විය. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානවන විටත් රු.1,327,620 ක් වටිනා පොත් 3,052 ක් මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකයේ ඉතිරිව තිබුණි.

(iii) විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශ මගින් පිරිනමනු කලා උපාධිය ප්‍රතිව්‍යුහගතකරණය යටතේ බහුමාධ්‍ය පාඨමාලා 18 ක් සහ මාර්ගගත පාඨමාලා 09 ක් 2014 මාර්තු සිට මාස 09 ක කාලයක් ඇතුළත සකස් කිරීම සඳහා රු.1,800,000 ගුණත්ව හා නව්‍යාතා ප්‍රදාන යටතේ ලබාදී තිබුණද ව්‍යාපෘති කාලසීමාව තුළ අදාළ කාර්යය නිමකර නොතිබුණි.

(iv) විශ්වවිද්‍යාලයේ මාධ්‍ය මන්දිරය (CETMe) මගින් ශ්‍රව්‍ය දෘශ්‍ය ඉගැන්වුම් ආධාරක නිෂ්පාදනය කර ඩිජිටල් පුස්තකාල (Digital Library) පහසුකම යටතේ අන්තර්ජාලය හරහා ශිෂ්‍යයන්ට එම ඉගැන්වුම් ආධාරක නැරඹීමේ අවස්ථාව ලබාදීමට අදාළ ව්‍යාපෘතිය මගින් සැලසුම් කර තිබුණි. ඒ අනුව, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉගැන්වීම් ආධාරක 52 කට ආසන්න ප්‍රමාණයක් නිෂ්පාදනය කර තිබුණද ව්‍යාපෘතිය මගින් ලබාදී ඇති රු.1,940,688 ක් වටිනා Server හරහා එම ඩිජිටල් පුස්තකාල පහසුකම ශිෂ්‍යයන් වෙත ලබාදීමට කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි රු.6,590,875 ක වැඩිදියුණු කිරීම් (Enhancement) 16 ක් නිමකිරීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර අත්තිකාරම් ලෙස එම සමාගම වෙත 2017 අගෝස්තු 08 දින රු.3,298,437 ක් ගෙවා තිබුණි. 2018 පෙබරවාරි මාසය වන විට මෙම කාර්යයන් නිම කළ යුතු වුවත් විගණිත දිනය වූ 2018 මැයි 28 වන විටත් නිමකර තිබුණේ පිරිවැය රු.156,250 වූ එක් වැඩි දියුණු කිරීමක් පමණක් වූ අතර ප්‍රමාදවීම් සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබූ අතර ගිවිසුම් ප්‍රකාරව දඩ අයකිරීමද සිදුකර නොතිබුණි.

(ආ) කළමනාකරණ තොරතුරු පද්ධතිය නඩත්තු කිරීම සඳහා පෞද්ගලික සමාගමක් වෙත වාර්ෂිකව රු.මිලියන 4.5 බැගින් අඛණ්ඩව ගෙවා තිබුණද අදාළ තොරතුරු පද්ධතිය තුළින් නිවැරදි හා කාර්යක්ෂම සේවාවක් ලබාදීමට එම සමාගමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. එසේම ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් පාලනයක් සිදුවී නොමැති බවත් සේවාව ඇගයීමකින් තොරව අදාළ ගෙවීම් සිදුකර ඇති බවත් නිරීක්ෂණය විය.

(ඇ) ආයතනයේ පරිහරණය සඳහා ලබාගෙන ඇති ඉඩම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා ප්‍රාදේශීය මධ්‍යස්ථාන පවත්වාගෙන යන අක්කර 75 ක් වූ ඉඩම් 29 ක් අතුරින් විශ්වවිද්‍යාලය වෙත නීත්‍යානුකූල හිමිකම් ලබාගෙන ඇති අක්කර 53 ක් වූ ඉඩම් 07 ක් පමණි. ඉතිරි අක්කර 22 කින් සමන්විත වූ ඉඩම් 22 ක අයිතිය විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීම කෙරෙහි ඉහළ කළමනාකාරිත්වය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. තවද මාතර, මහනුවර, කළුතර හා කෑගල්ල යන ප්‍රදේශ තුළ විශ්වවිද්‍යාලය විසින් පරිහරණය කරන අක්කර 18 ක ඉඩම්වල අයිතිය විශ්වවිද්‍යාලය වෙත පවරාදී වර්ෂ 08 ත් 30 ත් අතර කාලපරාසයක් ගතවී තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම හිමිකම් ඔප්පු ලබාගෙන නොතිබුණි.

(ii) අම්පාර අධ්‍යයන මධ්‍යස්ථානය පවත්වා ගෙන යන පර්චස් 77 ක් වූ ඉඩම 2004 සැප්තැම්බර් 24 දින සිට වසර 30 ක කාලයක් සඳහා බදු පදනම මත ලබාගෙන තිබූ අතර ඒ සඳහා 2004 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.203,000 ක් බදු කුලී ලෙස ගෙවා තිබුණ නමුත් විධිමත් බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

(iii) අක්කර 03 ක් වූ බදුල්ලේ බදුලුපිටිය ඉඩම සහ පර්චස් 62 ක් වූ රත්නපුර ඉඩම විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීම සඳහා එහි තක්සේරු වටිනාකමින් සියයට 25 ක් බැගින් පිළිවෙලින් 2013 මාර්තු 20 දින රු.100,000 ක් සහ 2011 අගෝස්තු 09 දින රු.443,750 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ගෙවා තිබුණ නමුත් 2017 දෙසැම්බර් 31 දින දක්වාම එහි ඉඩම්වල අයිතිය පවරාගෙන නොතිබුණි. කෙසේ වුවද, බදුලුපිටිය ඉඩම විශ්වවිද්‍යාලයට ලබාදිය නොහැකි බව දන්වා ඇති බැවින් ඒ සඳහා ගෙවන ලද මුදල් නැවත විශ්වවිද්‍යාලය වෙත ලබාදෙන ලෙස ප්‍රාදේශීය ලේකම් බදුල්ල වෙතින් ඉල්ලීමක් කර ඇති බව මේ සම්බන්ධයෙන් උපකුලපතිවරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ඈ) කෙටිකාලීන පාඨමාලා හා ස්වයං මූල්‍ය සම්පාදනය සඳහා අධ්‍යාපනික වැඩසටහන (C – Sap) හරහා පවත්වන පශ්චාත් උපාධි පාඨමාලා වලින් ලැබෙන ආදායමෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් විශ්වවිද්‍යාලයේ අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) පුස්තකාලය තුළ පැවති පැරණි මොඩියුලයේ (Libsys) අඩුපාඩු හේතුවෙන් නව මොඩියුලයක් 2014 නොවැම්බර් 01 දින ස්ථාපිත කර තිබූ නමුත් එදිනට පැවති පොත් පිළිබඳව භෞතික තොග සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. ඒ අනුව වසර 10 කට අධික කාලයක් තුළ පොත් පිළිබඳව තොග සමීක්ෂණයන් සිදුකර නොතිබීම හේතුවෙන් අඩුපාඩු සහිත පැරණි මොඩියුලයේ තොරතුරු මත පදනම්ව සකස් කළ නව මොඩියුලයේ තොරතුරු වල නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය. එමෙන්ම අධ්‍යයන මධ්‍යස්ථාන 18 ක පුස්තකාල භාවිතා කිරීමකින් තොරව වසා දමා තිබූ බව විගණනයේදී සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඊ) විවෘත විශ්වවිද්‍යාලයේ මධ්‍යම පොත් බෙදාහැරීමේ අංශය තුළ 2016 වර්ෂය තුළ ස්ථාපනය කර තිබූ නව පරිගණක මෘදුකාංග පද්ධතියේ කිසියම් නිශ්චිත දිනකට පවතින පාඨමාලා පොත් නිවැරදිව හඳුනා ගැනීමට හැකි වන පරිදි එම පද්ධතිය යාවත්කාලීන කර නොතිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට භෞතික තොග ශේෂය හා මෘදුකාංග පද්ධතියට අනුව ශේෂය අතර රු.5,193,446 ක් වටිනා පොත් 28,748 ක ඌනතාවයක්ද, රු.4,794,294 ක් වටිනා පොත් 30,580 ක අතිරික්තයක්ද දක්නට ලැබුණි.

(උ) මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකයේ වාර්ෂික තොග සමීක්ෂණය කරන අවස්ථාවේදී මෘදුකාංග පද්ධතිය තුළ පැවති රු.424,500 ක් වටිනා පොත් 2,830 ක් භෞතිකව අදාළ අංශ වෙත නිකුත් කර තිබුණද එම තොග මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකයේ පරිගණක පද්ධතියෙන් ඉවත් කර නොතිබුණි.

(ඌ) මුද්‍රණ අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන පොත් මුද්‍රණය කිරීම හේතුවෙන් 2015 වර්ෂය වන විට පොත් 103,868 ක් ඉවත්කර තිබූ අතර 2018 මාර්තු 08 දිනට විගණන අවස්ථාවේදී භාවිතයට ගත නොහැකි පොත් ප්‍රමාණය 39,007 ක් විය. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසාන වන විට විවිධ පීඨ සහ අධ්‍යයන අංශ විසින් යල්පැනගිය පොත් ලෙස සලකා ඉවත් කළ යුතු පොත් ලේඛනයක් සකස් කරමින් පැවතුණි. විගණන දිනය වූ 2018 ජුනි 06 දිනවන විට යල්පැන ගිය පොත් ලෙස පිරිවැය රු.11,426,630 ක් වූ පොත් 66,816 ක් හඳුනාගෙන තිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

විවිධ අරමුදල් 40 කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට ඌන උපයෝජිතව පැවති ශේෂය රු.24,293,376 ක් වූ අතර මෙයින් අරමුදල් 12 ක පැවති රු.7,810,535 ක් වසර 10 ක් තිස්සේ උපයෝජනය කර නොතිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවල විදුලිය විසන්ධිවීමකදී ප්‍රයෝජනයට ගැනීමට හැකි වන පරිදි විදුලිජනක යන්ත්‍ර ලබාදී තිබුණ නමුත් එහෙත් ඒවා ක්‍රියාවිරහිතව පැවතීම හා ධාරිතාවය ප්‍රමාණවත් නොවීම මත ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. අදාළ මධ්‍යස්ථානවල කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා එම යන්ත්‍ර අලුත්වැඩියා කිරීමට සහ ප්‍රමාණවත් ධාරිතාවයකින් යුතු විදුලිජනක යන්ත්‍ර ලබාදීම කෙරෙහි කළමනාකාරීත්වයේ අවධානය යොමු කර නොතිබුණි.

(ආ) ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන ව්‍යාපෘතිය දින විවෘත විශ්වවිද්‍යාලයට භාරදෙන අවස්ථාවේදී පැවති අක්‍රීය වත්කම් හා නිසිලෙස නඩත්තු කටයුතු සිදු නොකිරීම නිසා අක්‍රීය වූ වත්කම් විශාල ප්‍රමාණයක් ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවල පැවතුණි. එහෙත් ඒවා අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය තුළ මුද්‍රණාලයේ ලේඛන අනුව මුළු මුද්‍රණ පිරිවැය රු.66,499,117 ක් වූ අතර මුද්‍රිත පිටු ගණන 48,654,337 ක් විය. ඒ අනුව එක් පිටුවක් සඳහා සාමාන්‍ය වියදම රු.1.37 ක් වී තිබුණි. අදාළ ගොඩනැගිල්ල සඳහා බදු කුලියක් සහ කතෘභාගය (පුරස්කාරය) සඳහා කිසිදු පිරිවැයක් අන්තර්ගත නොකර ඉහත ගණනය සිදුකළ අතර එම පිරිවැයද ඇතුළත් කළේ නම් පිටුවක පිරිවැය තවදුරටත් ඉහළ යනු ඇත. මුද්‍රණ ඇනවුම් කිරීමේ ප්‍රමාදය නිසා සේවක අතිකාල වැනි අතිරේක පිරිවැයක් දැරීමට සිදුවීමද මුද්‍රණ පිරිවැය වැඩිවීම කෙරෙහි බලපා තිබුණි.

# 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලඟාකර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක්ම විසින් කටයුතු කළ යුතුව පවතින අතර ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාළව විවෘත විශ්වවිද්‍යාලය තම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන තිබුණි.

එහෙත් එම අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකාරී හා සංයුක්ත සැලැස්මේ අදාළ ක්‍රියාකාරකම් අන්තර්ගත කර තිබුණද අදාළ කාර්යයන් ඉටුකරගැනීමේ ප්‍රගතිය අවම මට්ටමක පවතින බව කාර්යසාධන වාර්තා තුළින් තහවුරු විය.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
------------------------------------------------

### 6.1 අභ්‍යන්තර විගණනය
-------------------------

පසුගිය වර්ෂ 04 ක කාලය තුළ අභ්‍යන්තර විගණන විමසුම් 40 ක් නිකුත් කර තිබූ අතර එයින් පිළිතුරු ලබාදී තිබුණේ විගණිත දිනය වූ 2018 අගෝස්තු 24 දින වන විට විමසුම් 05 කට පමණි. ඒ අනුව, මුදල් රෙගුලාසි 133 සහ 134 හි සඳහන් විධිවිධාන සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ චක්‍රලේඛ ප්‍රකාරව ආයතනයේ අභ්‍යන්තර විගණනය සිදුකිරීම කෙරෙහි කළමනාකාරීත්වය අවධානය යොමුකර නොතිබුණි.

### 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය
--------------------------------------------------

#### 6.2.1 ප්‍රසම්පාදනයන්
-------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව, 2017 මාර්තු 01 දින වන විට ආරම්භ කළ යුතු බවට සැලසුම් කර තිබූ රු.මිලියන 1,851ක් වූ ව්‍යාපෘති 20 ක් අතුරින් ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 1,374 ක් වූ ව්‍යාපෘති 17 ක ප්‍රසම්පාදන කටයුතු 2018 පෙබරවාරි වන විටද ආරම්භ කර නොතිබුණි.

(ආ) පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2016 නොවැම්බර් 14 දින රු.මිලියන 169.05 ක මුදලක් අනුමත කර ගෙන තිබුණි. ඒ අනුව ඉහත දින සිට මාස 12 ක් තුළ ජාතික තරඟකාරී ලංසු කැඳවා කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන ඉදිකිරීම නිමකළ යුතු බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ ලිපියට අනුව දන්වා තිබුණද 2018 පෙබරවාරි වන විටද අදාළ සැලසුම් සකස් කර ලංසු කැඳවා තෝරාගත් කොන්ත්‍රාත්කරුවන්ට ඉදිකිරීම භාරදීමක් සිදුකර නොතිබුණි.

(ඇ) 2016 උපාධි ප්‍රදානෝත්සවයේ ඡායාරූප ගැනීම සඳහා ඡායාරූපගාරයක් තෝරාගැනීමට 2017 මැයි සිට 2017 සැප්තැම්බර් දක්වා මාස 05 ක කාලයක් ගතකර තිබුණි. අදාළ ප්‍රසම්පාදනය සඳහා පළමුව සීමිත මිල ගණන් කැඳවීම් කර තිබූ අතර පසුව විවෘත තරඟකාරීත්වයක් ඇති කිරීම සඳහා රු.169,146, ක් වැයකර අවස්ථා දෙකකදී පුවත්පත් දැන්වීම් පළකර තිබුණි. එහෙත් කාල ප්‍රමාදය හේතුවෙන් අදාළ කාර්යය නියමිත කාලය තුළ ඉටුකිරීම සඳහා විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය වෙත රු.178,000 ක් ගෙවා අදාල කාර්යය ඉටුකරවා ගෙන තිබූ අතර පුවත්පත් දැන්වීම් සඳහා දරන ලද වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ඈ) ඇස්තමේන්තුගත පිරිවැය රු.3,431,305 ක් වූ පුස්තකාල ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ලංසු ඇගයීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 (අ) ඡේදයට අනුව තීරණාත්මක හෝ ඉතා වැදගත් අයිතමයන් පිළිබඳව ලංසුකරු විසින් අතාත්වික අනුප්‍රමාණයන් සඳහන් කර ඇති විටකදී හා 7.9.11(ආ) ඡේදය අනුව

ඉල්ලා ඇති අඩු අනුප්‍රමාණයන් ඇතුළත ඔවුන්ගේ වගකීම ඉටුකිරීමට ලංසුකරු අපොහොසත් වන බව තාක්ෂණික ඇගයීම් කමිටුවේ මතය නම් එම ලංසු ප්‍රතික්ෂේප කළ හැකිය. එහෙත් එකී නියමයන්ට අනුව කටයුතු නොකර අඩු රේටයන් පිළිබඳ නොසලකා කොන්ත්‍රාත්තුව ලබාදීම නිර්දේශ කර තිබුණි.

(ii) කිසියම් ලංසුකරුවෙක් ඉදිරිපත් කර ඇති අනුප්‍රමාණ අනුව වැඩ ඉටුකිරීමට කොන්ත්‍රාත්කරුට ඇති හැකියාව පිළිබඳව ගැටළු සහගත තත්ත්වයක් ඇත්නම් එම අවදානම අඩු කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 (ඇ) හි ප්‍රකාරව ඉහළ වටිනාකමකින් යුත් කාර්යසාධන සුරක්ෂණයක් (Performance Bond) ඉල්ලා සිටිය හැකි වුවද මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් එකී නියමයන්ට අනුව කටයුතු කර නොතිබුණි.

(iii) ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුව ආරම්භ කළ යුතු දිනය 2017 ජූලි 10 දින වන අතර එදින සිට සති 12 ක් ඇතුළත එනම් 2017 ඔක්තෝබර් 12 දින වන විට කොන්ත්‍රාත්තුව නිමකළ යුතු වුවද තෝරාගත් කොන්ත්‍රාත්කරු ඉතා වැදගත් කාර්යයන් 03 ක් සම්පූර්ණ නොකර කොන්ත්‍රාත්තුව අතරමඟ නවතා දමා තිබුණි. එසේම රු.171,565 ක් වන කාර්යසාධන බැඳුම්කරය 2017 නොවැම්බර් 10 දින කල්ඉකුත් වී තිබූ අතර එය දීර්ඝ කරවාගැනීමට කටයුතු නොකිරීම නිසා අදාළ අලාභයන්ද අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) ඇස්තමේන්තු ගත පිරිවැය රු.4,494,118 ක් වූ පුස්තකාල ගොඩනැගිල්ලේ නැවත විදුලි රැහැන් ඇදීමේ කොන්ත්‍රාත්තුවේ ගිවිසුම් ප්‍රකාරව, 2016 මැයි 30 දින සිට දින 60 ක් තුළදී කොන්ත්‍රාත්තුව නිමකළ යුතු වුවද 2018 මාර්තු 05 දක්වාම අදාල කාර්යය නිම කර නොතිබුණු අතර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරවාගැනීමටද කටයුතුකර නොතිබුණි. තවද 2016 සැප්තැම්බර් 16 දින වන විට රු.224,705 ක් වූ කාර්යසාධන ඇපකරයේ වලංගු කාලය අවසන් වී තිබුණද එය දිර්ඝ කරවා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

## 6.2.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-----------------------------------------

විශ්වවිද්‍යාලය සඳහා පිරිවැය රු.මිලියන 45 ක සූර්ය පැනල සවිකිරීමේ ව්‍යාපෘතියක් ඉදිකිරීම වෙනුවෙන් 2015 පෙබරවාරි 23 දින පුද්ගලික සමාගමක් සමග ගිවිසුමකට එළඹ තිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12.2 ඡේදය අනුව පූර්ව සුදුසුකම් පිළිබඳ නිසි අයුරින් පරීක්ෂා නොකර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම නිසා අදාළ ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි. එහෙත් අදාළ ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා විකල්ප වැඩපිළිවෙලක් කෙරෙහි කළමණාකරණයේ අවධානය යොමුකළ බවද විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

## 6.3 අයවැය ලේඛනමය පාලනය

----------------------------------

අයවැය ගත ආදායම් හා වියදම් සත්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේදී සියයට 40 සිට සියයට 1,356 දක්වා ප්‍රමාණාත්මක විචලතාවයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

----------------------------------

2012 දෙසැම්බර් 31 දිනට අවසන්වරට සිදුකර තිබූ ප්‍රත්‍යාගණනය නිසි අයුරින් සිදුකර නොතිබීම පිළිබඳව විගණන වාර්තා මගින් පෙන්වාදුන් අඩුපාඩු මෙම වාර්තාවේ දින වනවිටත් නිවැරදි කර නොතිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර<br>---------------------------- | නිරීක්ෂණ<br>------------ |
|---|---|---|
| (අ) | අභ්‍යන්තර විගණනය | ආයතනයේ අවදානම් පාදක කරගත් අභ්‍යන්තර විගණනයක් සිදුනොවීම මත ආදායම්, වියදම් ඇතුළු බොහෝමයක් ක්ෂේත්‍ර වල අඩුපාඩු නිරන්තරයෙන් පැවතීම. |
| (ආ) | තොග පාලනය | ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවල තොග ශේෂයන්හි නිවැරදිතාවයන් තහවුරු කර ගැනීමට හැකිවන පරිදි පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කර නොතිබූ අතර විධිමත් පරිදි තොග ලේඛන නඩත්තු කර නොතිබීම. |
| (ඇ) | ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පාලනය | (i) විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කර නොතිබීම.<br><br>(ii) ඉදිකිරීම් කොන්ත්‍රාත් කටයුතුවලදී අවිධිමත් අයුරින් කටයුතු කිරීම නිසා ව්‍යාපෘති නිමකිරීම් ප්‍රමාද වී තිබීම. |
| (ඈ) | ආදායම් කළමනාකරණය | (i) ගිවිසුම් කඩකිරීමෙන් ලද ආදායම අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන නොතිබීම.<br><br>(ii) ශිෂ්‍ය ආදායම සම්බන්ධ තොරතුරු සහ එයට අදාළ සංක්ෂිප්ත වාර්තා ලබා ගැනීමට හැකි පරිදි කළමනාකරණ තොරතුරු පද්ධතිය සකස් වී නොතිබීම. |
| (ඉ) | ස්ථාවර වත්කම් කළමනාකරණය | (i) දේපළ පිරියත හා උපකරණ නිවැරදිව තක්සේරු නොකිරීම නිසා ස්ථාවර වත්කම් වටිනාකම් නිවැරදි නොවීම සහ ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු නිසි පරිදි ඉටුකර නොතිබීම.<br><br>(ii) භාණ්ඩ සමීක්ෂණ වාර්තා වල නිර්දේශයන්ට අනුව කටයුතු කර නොතිබීම. |
| (ඊ) | වාහන පාලනය | (i) වාහන ලොග් පොත් හා ධාවන සටහන් නිසි පරිදි නඩත්තු කර නොතිබීම.<br><br>(ii) ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබීම. |